# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,130- 2019 ජුනි මස 28 වැනි සිකුරාදා - 2019.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1236 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජූලි මස 19 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජූලි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1235 - B 81537 — 5,403 (2019/06)
F 1 -

# අතුරු ව්‍යවස්ථා

## කල්පිටිය ප්‍රාදේශීය සභාවේ රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සායාමේ පුහුණු කාර්යය සඳහා වූ ප්‍රදේශ කළමනාකරණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තියෙහි (vi) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් සම්පාදනය කරන ලද මෙහි පහත උපලේඛනයේ දැක්වෙන කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සායාමේ පුහුණු කාර්යය සඳහා වූ ප්‍රදේශ කළමනාකරණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, 2019 අප්‍රේල් මස 09 දින පැවැති එකී ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ දී අංක 11(8) දරන යෝජනාව මගින් සම්මත වී ඇත.

ඒ අනුව, එම අතුරු ව්‍යවස්ථාව, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වන වගන්තියෙහි (1) උප වගන්තියෙන් වයඹ පළාත් සභාවේ ආණ්ඩුකාරවර පේශල ජයරත්න බණ්ඩාර වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මවිසින් අනුමත කරන ලද බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

පේශල ජයරත්න බණ්ඩාර,
ආණ්ඩුකාරවර.

වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
2019 මැයි මස 24 වැනි දින.

*රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සා යාමේ පුහුණු කාර්යය සඳහා වූ ප්‍රදේශ කළමනාකරණය කිරීමේ අතුරු ව්‍යවස්ථාව*

1. කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් විසින් රුවල් හා සරුංගල් මගින් ජල මත ලිස්සා යාමේ පුහුණු සේවා පවත්වාගෙන යාම උදෙසා උචිත ප්‍රදේශ වශයෙන් කල්පිටිය ප්‍රාදේශීය සභාවේ පාලනය හා කළමනාකරණය යටතට පත් කරනු ලැබුවා වූ කලපුව ඒ ආශ්‍රිත වෙරළ ප්‍රදේශ (මෙහි මින් මතු ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලබන) එහි පුහුණු සේවාවන් යටතේ පාලනය කිරීම, කළමනාකරණය කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) සමග කියවිය යුතු 126 (vi) වගන්තිය යටතේ මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව කල්පිටිය ප්‍රාදේශීය සභාවේ රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සා යාමේ පුහුණු කාර්යය සඳහා වූ ප්‍රදේශ කළමනාකරණය කිරීමේ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලබයි.

4. (i) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ 1 වැනි උපලේඛනයට සාරානුකූල වූ සභාපතිවරයාගෙන් ලබාගත් අවසර පත්‍රයක් යටතේ මිස කවර හෝ තැනැත්තෙක්, ආයතනයක් විසින් මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ ප්‍රදේශයක රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සා යාමේ පුහුණු කාර්යයක නොයෙදිය යුතුය.

   (ii) යම් තැනැත්තෙක් වෙත නිශ්චිත ස්ථානයක් සඳහා පුහුණුව සඳහා අවසර ලබා දිය හැකි උපරිම පුහුණුවන්නන් සංඛ්‍යාව එම ස්ථානයට අදාළ වන වෙරළ තීරයේ දිග මීටර් ප්‍රමාණය මත තීරණය කළ යුතුය.

   (iii) කවර හෝ තැනැත්තෙකු තමන් වෙත අවසර ලබාදී ඇති පුහුණුවන්නන් ප්‍රමාණය ඉක්මවන පරිදි පුහුණු වන්නන් පුහුණු කිරීමේ කාර්යයක නොයෙදිය යුතුය.

   (iv) පුහුණු කාර්යයේ යෙදෙන අවස්ථාවලදී එක් එක් පුහුණු ආයතනවල පුහුණුවන්නන් වෙන වෙනම හඳුනාගත හැකි පරිදි සභාව නම් කරනු ලබන පැහැයක කබා පැළඳ සිටිය යුතුය.

5. (i) ඉහත 4 වන වගන්තිය යටතේ සඳහන් අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම කල්පිටිය ප්‍රාදේශීය සභාව වෙත මුදල් ගෙවා ලබාගත් මෙම අතුරු ව්‍යවස්ථාවේ II වන උපලේඛනයට සාරානුකූලව වූ ඉල්ලුම් පත්‍රයක් මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(ii) මෙම වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් සඳහා අය කළ යුතු ගාස්තු සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් තීරණය කර *ගැසට්* නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තුවක් විය යුතුය.

(iii) මෙම වගන්තිය යටතේ වූ ගාස්තු, වාර්ෂික අවසර පත්‍රයක්ය යන පදනමින්, හා එක් අවසර පත්‍රයක් සඳහා පුහුණුලාභීන් ප්‍රමාණය අනුව තීරණය කළ යුතු ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය යටතේ නිකුත් කරන සෑම අවසර පත්‍රයක්ම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි කඩ කිරීම හේතු කොටගෙන කලින් අවසන් කරනු ලැබුවහොත් මිස නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන්නේ ය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙක්ම පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබිය යුතුය.

(i) තත්කාර්ය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(ii) පුහුණු කිරීමේ කාර්යය, රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සා යාමේ ක්‍රීඩාව සම්බන්ධ අන්තර්ජාතික පුහුණු බලපත්‍රයක් ලබාගත් පුහුණුකරුවන් යටතේ පවත්වාගෙන යා යුතු අතර, ඒ බව වලංගු පුහුණු බලපත්‍රය මඟින් තහවුරු කළ යුතුය.

(iii) පුහුණු කාර්යය සඳහා පුහුණු මධ්‍යස්ථානයක් කලපුව හා වෙරළ ආශ්‍රිතව මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ ප්‍රදේශයක පවත්වාගෙන යනු ලබන විටක දී, ඊට අදාළ ඉදිකිරීම් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූලව ඉදිකර තිබිය යුතු අතර, අනුමත සැලැස්මේ පිටපතක් අමුණා තිබිය යුතු ය.

(iv) පුහුණුවන්නන් සඳහා අවශ්‍ය ප්‍රථමාධාර පහසුකම් ඇතුළුව අනෙකුත් සෞඛ්‍ය සනීපාරක්ෂක පහසුකම් නිසි හා යෝග්‍ය ආකාරයකින් පවත්වාගෙන යන බවට ප්‍රදේශයට අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ නිර්දේශය සමඟ ඊට අදාළ ඉල්ලීම් ඉදිරිපත් විය යුතු ය.

8. පුහුණු කාර්යයක් සඳහා මෙම බල ප්‍රදේශය තුළ වෙරළ තීරයක් හෝ කලපු තීරයක් හඳුනාගැනීම සහ හඳුනාගත් වෙරළ හා කලපු තීරයකට අදාළව ලබා දිය යුතු උපරිම අවසර පත්‍ර ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් හා ප්‍රාදේශීය සභාවේ ලේකම්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු කල්පිටිය කොට්ඨාසය භාර කළමනාකරු, ධීවර සහකාර අධ්‍යක්ෂ, ප්‍රාදේශීය නිලධාරි සංචාරක සංවර්ධන අධිකාරිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය යන අයගෙන් සමන්විත කමිටුවක් මඟින් තීරණය කළ යුතු ය.

9. අවසර පත්‍රයක් යටතේ පුහුණු කාර්යයන් සිදු කළ හැකි කාලසීමාව පෙ.ව. 9.00 සිට ප.ව. 6.00 දක්වා විය යුතු අතර, කිසිදු ආකාරයකින් එම කාල සීමාවෙන් පරිබාහිර වේලාවක කිසිදු තැනැත්තෙකු පුහුණු කාර්යයක නොයෙදි යුතු ය.

10. පුහුණු කාර්යයක් සඳහා වෙරළ හා කලපු තීර භාවිතයට ගැනීමේදී කිසිදු ආකාරයකින් ධීවර කර්මාන්තය සඳහා භාවිතයට ගැනෙන, ඒ සඳහා නිශ්චිතව වෙන් කරන ලද වෙරළ කොටසක් භාවිතයට නොගත යුතු ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සිදු කරන පුහුණු කාර්යයන් සඳහා පහසුකම් සැලසීම සභාව විසින් සිදුකරනු ලැබේ.

12. කල්පිටිය ප්‍රාදේශීය ලේකම් සහ කල්පිටිය ප්‍රාදේශීය සභාව ඇති කර ගත් එකඟතාවය යටතේ කල්පිටිය ප්‍රාදේශීය සභාව පවත්වාගෙන යන කලපු තීරයෙහි කොටසක කයිට් සර්ෆින් ක්‍රීඩාව කිරීම සඳහා කල්පිටිය ප්‍රාදේශීය සභාව තීරණය කරනු ලබන කාල පරාසයක් යටතේ ඒ වෙනුවෙන් III වැනි උපලේඛනයට සාරානුකූල වූ තාවකාලික අවසර පත්‍රයක් සභාපති විසින් නිකුත් කිරීම නීත්‍යානුකූල වන අතර ඒ සඳහා කල්පිටිය ප්‍රාදේශීය සභාව වෙතින් ලබාගත් මෙම අතුරු ව්‍යවස්ථාවේ IV වන උපලේඛනයට සාරානුකූල වූ ඉල්ලුම් පත්‍රයක් යටතේ ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

13. 12 වන වගන්තිය යටතේ වූ අවසර පත්‍රයක් සඳහා අයකළ යුතු ගාස්තු සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් තීරණය කර *ගැසට්* නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තුවක් විය යුතුය.

14. කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයකු වෙරළ තීරයක විනෝදය පිණිස සිදු කරන රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සා යාමේ ක්‍රියාවක නිරතවීම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ කාර්යයන් සඳහා අදාළ නොවිය යුතු ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිම පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) වන උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ,

''සභාපති'' යන්නෙන් කල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති ද,

''සභාව'' යන්නෙන් කල්පිටිය ප්‍රාදේශීය සභාව ද,

''ප්‍රාදේශීය ලේකම්'' යන්නෙන් කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළ ප්‍රාදේශීය ලේකම් ද,

''තැනැත්තෙක්'' යන්නෙන් රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සා යාමේ පුහුණු සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් ක්‍රියාත්මක වන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ස්ථාපිත ආයතනයක්, පුද්ගලයෙකු හෝ පුද්ගල මණ්ඩලය ද, ''බලයලත් නිලධාරී'' යන්නෙන් කල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාව මඟින් තත්කාර්ය සඳහා බලය පවරන ලද නිලධාරියෙකු ද අදහස් වේ.

## I වැනි උපලේඛනය

අවසර පත්‍ර අංකය :..........................................

### කල්පිටිය ප්‍රාදේශීය සභාව

රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සා යාමේ පුහුණු පාසල සඳහා අවසරපත්‍රය 20................ වර්ෂය

1. *(අ)* පුහුණු පාසලේ නාමය :..........................................
   *(ආ)* පුහුණු පාසලේ ස්වභාවය (තනි/හවුල්/සමාගම) :..........................................

2. පුහුණු පාසල පවත්වනු ලබන ස්ථානයේ -

   *(අ)* ලිපිනය :..........................................
   *(ආ)* වරිපනම් අංකය :..........................................

3. *(අ)* කර්මාන්තය/වෙළෙඳාම හිමිකරුගේ නම :..........................................
   *(ආ)* ජාතික හැඳුනුම්පත් අංකය :..........................................

කලින් අවලංගු කරනු නොලැබුවේ නම් අවසරපත්‍රය 20................ වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් විය යුතුය. තව ද, මේ අවසරපත්‍රය නිකුත් කරනු ලබන්නේ ඉහත කී පුහුණු පාසල පවත්වාගෙන යාමට ඉහතින් නිශ්චිත සඳහන් කරන ලද ස්ථානය පාවිච්චි කිරීමට පමණකි. එසේම මෙය එකී ස්ථානය සඳහා නීත්‍යානුකූල අයිතිවාසිකමට අදාළ වීමක් නොවිය යුතු ය.

අවසරපත්‍රය පැහැදිලිව ප්‍රදර්ශනය වන සේ ඉහත කී ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතුයි.

වරකට පුහුණුවිය හැකි පුහුණුවන්නන්ගේ උපරිම සංඛ්‍යාව :..........................................

ගෙවන ලද ගාස්තුව : රු............................ ලදුපත් අංකය :............................ දිනය : 20...............................

.............................................
සභාපති,
ප්‍රාදේශීය සභාව,
(නිල මුද්‍රාව).

දිනය : 20.............................

## II වැනි උපලේඛනය

කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ..........................................................ස්ථානයේ රුවල් හා සරුංගල් මඟින් ජලය මත ලිස්සා යාමේ පුහුණු පාසලක් සඳහා අවසරපත්‍රයක් ලබාගැනීමේ අයදුම්පත

1. පුහුණු පාසලේ නම :..........................................................................................................
2. ලිපිනය :..........................................................................................................
3. දුරකතන අංකය :..........................................................................................................
4. ග්‍රාම නිලධාරි වසම :..........................................................................................................
5. ස්වභාවය (තනි/හවුල්/සමාගම) :..........................................................................................................
6. අයිතිකරුගේ නම :..........................................................................................................
7. අයිතිකරුගේ ලිපිනය :..........................................................................................................
8. හැඳුනුම්පත් අංකය :..........................................................................................................
9. ව්‍යාපාරයේ සුදුසුකම්ලත් පුහුණුකරුවන්ගේ සංඛ්‍යාව :..........................................................................................................
   (පුහුණු බලපත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුය.)
10. අනුමත ඉදිකිරීම් සැලැස්මේ දිනය හා අංකය
    (සැලැස්මේ පිටපතක් ඇමිණිය යුතුය.)
11. අනුකූලතා සහතිකයේ දිනය හා අංකය :..........................................................................................................
    (සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත්, ගාස්තු අයකර පුහුණුවන්නන්............................................. සඳහා අවසරපත්‍රය ලබා දෙන ලෙසත් කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති සියලු කොන්දේසි හා නියෝගවලට මා යටත් වන බවත් මෙයින් අත්සන් කර පොරොන්දු වෙමි.

.............................................
(අයදුම්කරුගේ අත්සන.)

දිනය :...........................................

---

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - කල්පිටිය**

පුහුණුවන්නන් සඳහා අවශ්‍ය ප්‍රථමාධාර පහසුකම් ඇතුළුව අනෙකුත් සෞඛ්‍ය සනීපාරක්ෂක පහසුකම් නිසි හා යෝග්‍ය ආකාරයෙන් පවත්වාගෙන යන බවට ඔබගේ වාර්තාව ලබා දෙන්න.

.............................................
ලේකම්,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

දිනය :...........................................

*මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශය :*

.............................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය :...........................................

*සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ නිර්දේශය :*

ඉහත සඳහන් මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව අනුව 20................. වසර සඳහා අවසරපත්‍රය ලබාදීම නිර්දේශ කරමි/නොකරමි.

.................................................
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි.

දිනය :...........................................

*ආදායම් පරීක්ෂකගේ සටහන :*

අයකල යුතු ගාස්තුව :...........................................
දිනය :...........................................

.............................................................................
ආදායම් පරීක්ෂක/කළමනාකරණ සහකාර.

දිනය :...........................................

අදාළ ව්‍යාපාරික ස්ථානය සම්බන්ධයෙන් පුහුණුවන්නන්..........................................................................සඳහා අනුමත කරමි./නොකරමි.
අදාළ ගාස්තුව අයකර අවසර පත්‍රය නිකුත් කරන්න.

.................................................
දිනය :........................................... ලේකම්,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

*ආදායම් ප්‍රවර්ධන නිලධාරි සටහන :*

අවසරපත්‍ර නිකුත් කරන ලදී.

ලදුපත් අංකය :.........................................................................
අවසර පත්‍ර අංක :...................................................................

.
...................................................
ආදායම් ප්‍රවර්ධන නිලධාරි.

දිනය :..........................................

## III වැනි උපලේඛනය

තාවකාලික අවසරපත්‍ර අංකය :.....................................................

*කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ.............................................................. ස්ථානයේ රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සා යාමේ ක්‍රීඩාව සිදුකිරීම සඳහා තාවකාලික අවසරපත්‍රය*

1. නම :..............................................................................................................................................................
2. හැඳුනුම්පත් අංකය/විදේශ ගමන් බලපත්‍ර අංකය :.....................................................................................
3. ක්‍රීඩාව සිදුකිරීමට අවසර ලබා දී ඇති දිනය/දින :.......................................................................................

ගෙවන ලද ගාස්තුව : රු............................ ලදුපත් අංකය :............................ දිනය : 20...............................

.............................................
සභාපති,
ප්‍රාදේශීය සභාව,
(නිල මුද්‍රාව).

දිනය : 20.............................

IV වැනි උපලේඛනය

*කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ........................................................ ස්ථානයේ රුවල් හා සරුංගල් මගින් ජලය මත ලිස්සා යාමේ ක්‍රීඩාව සිදු කිරීම සඳහා තාවකාලික අවසර පත්‍රයක් ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රයයි*

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :..........................................................................................................
2. ස්ථිර ලිපිනය :..........................................................................................................
3. හැඳුනුම්පත් අංකය/විදේශ ගමන් බලපත්‍ර අංකය :..........................................................................................................
4. දුරකතන අංකය :..........................................................................................................
5. පුරවැසිභාවය :..........................................................................................................
6. ක්‍රීඩාව සිදුකිරීමට අපේක්ෂිත දිනය/දින :..........................................................................................................

ඉහත සඳහන් දිනවලදී....................................................................................... ස්ථානයේ රුවල් හා සරුංගල් මගින් ජල මත ලිස්සා යාමේ ක්‍රීඩාව සිදුකිරීමට තාවකාලික අවසර පත්‍රයක් නිකුත් කරන මෙන් ඉල්ලමි. කල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් කරනු ලබන නියමයන්ට එකඟවන බවට සහතික වෙමි.

..........................................
අත්සන.

දිනය :...........................................

ගාස්තු අයකර තාවකාලික අවසරපත්‍රය නිකුත් කරන්න.

..............................................
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

දිනය :...........................................

*ආදායම් ප්‍රවර්ධන නිලධාරි සටහන :*

අවසරපත්‍ර නිකුත් කරන ලදී.

ලදුපත් අංකය :..................................................................................
තාවකාලික අවසරපත්‍ර අංකය :........................................................

දිනය :...........................................

.......................................................
ආදායම් ප්‍රවර්ධන නිලධාරි.

06-763

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.